**2022.09.30 වන දින පෙ.ව. 9.30ට හපුතලේ ප්‍රාදේශීය සභාවේ**
**නව සභා රැස්වීම් ශාලාවේදී පැවති**
**හපුතලේ ප්‍රාදේශීය සභා විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව**

**පැමිණීම**

| | | | |
|---|---|---|---|
| 1. | බී. කන්දසාමි මහතා | - | ගරු සභාපති |
| 2. | වයි.එම්.නිමල් අමරසිරි මයා | - | ගරු උපසභාපති |
| 3. | සෙල්ලයියා සගාදේවන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 4. | ආර්.එම්. ඉන්ද්‍රතිලක රාමනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 5. | කේ.එම්.විමලසිරි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 6. | ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 7. | ගෝපාලන් මුරුගන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 8. | එල්.එච්. ඉන්දික සම්පත් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 9. | ඩී. සුදත් අරුණඅංජන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 10. | සවරිමුත්තු ප්‍රභාහර් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 11. | ප්‍රැන්ස්සි වයලට් රෝස් මිය | - | ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රිණී |
| 12. | මාරප්පන් කන්දසාමි මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 13. | තංගවේලු මහේන්ද්‍රන් මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |
| 14. | වේලුසාමි එලීල් අරසි මිය | - | ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රිණී |
| 15. | එම්.ඒ. නිල්මිණි චන්ද්‍රකාන්ති මිය | - | ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රිණී |
| 16. | එච්.ඒ.ඩී. චාන්දනී මානෙල් කුමාරි මිය | - | ගරු ප්‍රාදේශිය සභාමන්ත්‍රිණී |
| 17. | ආර්.එල්. සුදර්ශන මයා | - | ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී |

**1.** මහ සභ රැස්විම් වාර්තාව සම්මත කිරීම.

**නැත**

**2.** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

**නැත**

**3.** සංදේශ පෙත්සම් හා පැමිණිළි සභාව වෙත ඉදිරිපත් කිරීම.

**නැත**

**4.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

**නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

ඉදිරිපත් කිරීම-ගරු සභාපති බී.කන්දසාමි මහතා

2023 වර්ෂයේ කෙටුම්පත් ඇස්තමේන්තුව සඳහා සංශෝධන ඉදිරිපත් කර ඇත්නම් එකී සංශෝධන සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් එසේ නොමැති නම් සංශෝධන ඉදිරිපත් කර නොමැති බව සභාවට යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

2023 වර්ෂයේ කෙටුම්පත් ඇස්තමේන්තුව සඳහා සංශෝධන කිසිවක් සභාවට ඉදිරිපත් කර නොමැති බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂයේ කෙටුම්පත් ඇස්තමේන්තුව සඳහා සංශෝධන ඉදිරිපත් කර නොමැති බැවින් ගරු සභාවේ එකඟතාවය මූලාසනය විසින් විමසන ලද අතර, ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අත ඔසවා එකඟතාවය පළ කළ හෙයින් එකී යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

ඉදිරිපත් කිරීම-ගරු සභාපති බී.කන්දසාමි මහතා

2023 වර්ෂයේ අයවැය සඳහා ගරු සභාපතිතුමන් ගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා

විවාද

2023 වර්ෂයේ අයවැය සඳහා ගරු සභාපතිතුමන් ගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සිංහල හා දෙමළ භාෂා මාධ්‍ය භාවිතා කර ගරු සභාපතිතුමා විසින්ම ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

**යෝජනා අංක 03**

ඉදිරිපත් කිරීම-ගරු සභාපති බී.කන්දසාමි මහතා

2023 වර්ෂයේ හපුතලේ ප්‍රාදේශීය සභාවේ කෙටුම්පත් අයවැය ලේඛනය සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරන්නී ය.

ස්ථිර කිරීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. සීගිරි ලංකා ඒකනායක මහතා

විවාද

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් 2018.03.27 දින හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට පත්වී බල ප්‍රදේශයේ උන්නතිය උදෙසා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම ජනතාව වෙනුවෙන් ඉටු කළ හැකි වූ සියලු කාර්යයන් ඉටු කිරීමට කටයුතු සිදු කල බවත් එකී සියලු කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබා දුන් උප සභාපතිතුමා , විපක්ෂ නායකතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන හා සියලුම ආයතන වෙතත් විශේෂයෙන් ඌව පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා ඇතුලු එහි කාර්ය මණ්ඩලය වෙතත් හපුතලේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුලු කාර්යය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරන බව සඳහන් කරන ලදී.

එසේම 2019 වර්ෂයේ සිට නොකඩවා 05 වන වරටත් අයවැය සැකසීමේ කාර්යය ඉටුකිරීම සඳහා දායකත්වය සැපයූ බවත් ,විෂය භාර අමාත්‍යවරයාගේ තීරණය මත සභා ධූර කාල සීමාව තවත් වසරකින් දීර්ඝ කර ඇති බැවින් මෙය අවසන් අයවැය වාර්තාව බවත් සියලු උපායමාර්ග භාවිතා කරමින් සකසන ලද අයවැය වාර්තාව සඳහා ගරු සභික ඔබ සැමගේ සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. මහේන්ද්‍රන් මහතා අදහස් දක්වමින් අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමට පෙර ගරු සභාපතිතුමන් විසින් පැයක් පුරාවට තම ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව අදහස් පැහැදිලි කර දුන් බවත් මේ වන විට සභා ධූර කාලය වසර 5 ක් වන බවත් ගරු මන්ත්‍රීමණ්ඩලය විසින් විශාල වැටුපක් ලබා ගෙන කටයුතු කරන බවට මහජනතාව විසින් වර්තමානය වන විට මතයක් දරනවා සේම මන්ත්‍රීවරුන් විසින් අදිනු ලබන සුදු ඇඳුම හේතුවෙන් මහජනතාව අතර ගරුත්වයක් තිබුණ ද මේ වන විට මහජනතාව විසින් හෙළා දකින බවත් ප්‍රකාශ කරන ලදී.අයවැය කෙටුම්පත සම්බන්ධව

මෙන්ම සභා කටයුතු සම්බන්ධව මන්ත්‍රී ධූරයට තමන් ආධුනික බැවින් ආරම්භයේ දී විවිධ ගැටලු පැවතියද සභාපතිතුමන්ගෙන් මෙන්ම ලේකම්තුමියගෙන් ලද මඟපෙන් වීම මත ඒ සියල්ල මනාව වටහා ගත් බවත් වර්තමානය වන විට රටේ විවිධ දේශපාලන මතිමතාන්තර පැවතිය ද ගරු සභාපතිතුමන් හපුතලේ ප්‍රාදේශීය සභාවට හොඳ ක්‍රියා මාර්ග රැසක් සිදු කළ සභාපතිවරයෙක් බැවින් 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සම්බන්ධයෙන් තම මතය ඡන්ද අවස්ථාවේ දී ප්‍රකාශ කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.අයි.රාමනායක මහතා අදහස් දක්වමින් 2023 වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය හා අයවැය කෙටුම්පත සභා සම්මත කිරීමේ අවස්ථාවේ දී හුදෙක් සභාපති යන තනතුරට ඡන්දය පාවිච්චි කරනවා මිස පෞද්ගලිකව පුද්ගලයෙක් සඳහා ඡන්දය පාවිච්චි කිරීමක් සිදු නොකරන බවත් පක්ෂ ප්‍රතිපත්ති සමඟ දේශපාලන කටයුතු සිදු කරන බවත් ජනතාව මූලික කර ගනිමින් දේශපාලනය සිදු කරන බවත් ජනතාව අපේක්ෂාවෙන් සිටිනුයේ තමා නියෝජනය කරන පක්ෂයේ ප්‍රතිපත්ති සමඟ කුමන ආකාරයට දේශපාලනය සිදු කරනවාද යන්න බවත් පසුගිය කාලය තුළ රට තුළ පැවති දේශපාලන වාතාවරණය එය මනාව පැහැදිලි කර දුන් බවත් , 2018 මැතිවරණයෙන් ලංකා ඉතිහාසයේ මැතිවරණ ක්‍රමය වෙනස් කර පළාත් පාලන මන්ත්‍රීවරුන් ප්‍රමාණය වැඩි කළ බැවින් ගමේ ජනතාවට අවශ්‍ය වන සේවාවන් ඉටු කිරීම විධිමත් කිරීම අරමුණු කළ බවත් නමුත් 2018 මැතිවරණයෙන් පසු පත්වූ අවාසනාවන්තම කණ්ඩායම තම කණ්ඩායම බවත් ඊට හේතුව වන්නේ 2020 / 2021 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වය හමුවේ මෙන්ම ඉන් පසු රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ හපුතලේ ප්‍රාදේශීය සභාව අඩු ආදයම්ලාභී සභාවක් බැවින් ජනතා සේවයක් සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් පළාත් පාලන ආයතනයක් විසින් ප්‍රජාව අපේක්ෂා කරනු ලබන සේවයක් ඉටු කිරීමට නොහැකි වූ බව ගරු සභාපතිතුමන් , ගරු උප සභාපතිතුමන් මන්ත්‍රී මණ්ඩලය මෙන්ම ලේකම්තුමිය ද දැනුවත් නමුත් ප්‍රජාව විසින් හපුතලේ ප්‍රාදේශීය සභාවට ආදායම් සීමිත බව නොදැනුවත් බවත්, ප්‍රජාව විසින් මන්ත්‍රීන් කෙරෙහි අප්‍රසාදයෙන් පසු වන බවත් දීමනාව ලබා ගැනීම සඳහා පමණක් කටයුතු කරනවා මිස ප්‍රජාව වෙන්වෙන් කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකරනවා යන්න ප්‍රජාව විසින් මතයක් දරණ බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම 2018 වසරෙන් පසු පැවති අයවැය සඳහා ඡන්දය ලබා දීමේ දී පක්ෂව , විපක්ෂව මෙන්ම ඡන්දය දීමෙන් වැළකී සිටි බවත් ඒ සියලු දේ සිදු කරනුයේ ගරු සභාපති සමඟ තිබෙන්නාවූ පෞද්ගලික සම්බන්ධකම මත නොව මූලාසනයෙහි තනතුර සමඟ බවත් අයවැය සම්බන්ධ තීරණ ගනුයේ දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති සමග බවත්, 2023 අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමන් විසින් පනවා ඇති රීති අනුව ගරු මන්ත්‍රීවරුන්ගෙන් යෝජනා කැඳවුවද එසේ යෝජනාවන් නොලද හෙයින් තව දුරටත් බල ප්‍රදේශයේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා බල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති කැඳවා සංවර්ධන යෝජනා මෙන්ම ආදායම් උත්පාදන මාර්ග සම්බන්ධයෙන් ද අදහස් හා යෝජනා ලබා ගන්නා ලද බව සඳහන් බවත් ඒ අනුව 2022-09-04 වන දින පැවති රැස්වීම අනුව ප්‍රජාවගේ අදහස් කර ඇත්තේ සභාව සතුව මෙපමණ ආදායමක් සතු බවත් මෙලෙස වියදම් කිරීමේ හැකියාවක් සභාව සතු බැවින් සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකියාව පවතින බව ය. නමුත් යථාර්ථය අනුව අඩු ආදායම්ලාභී සභාවක් හේතුවෙන් ප්‍රජාවට එකී කරුණු පැහැදිලි කළ නොහැකි අතර සභාවේ සිදු කරන ලද වැඩ කටයුතු මත ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඉදිරි ගමන තීරණය වන බැවින් ප්‍රජාව වෙත අනාගතයේදී පිළිතුරු ලබා දීමට සිදු වුවහොත් ඒ සඳහා පිළිතුරක් අවශ්‍ය වන බවත්, 2023 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ලබා දීම සිදු නොකරන ලද්දේ සභාවේ මෙන්ම රටේ පවතින ආර්ථිකය මත යෝජනා දීමෙන් පලක් සිදු නොවන බැවින් මිස ගරු මන්ත්‍රී මණ්ඩලයේ නොසලකා හැරීමක් නිසා නොව පෙර ලබා දෙන ලද සංවර්ධන යෝජනා වලට සිදු වූයේ කුමක් ද යන සාධාරණ හේතුව මත මිස පෞද්ගලික අමනාපකම් මත නොවන බවත් ගරු සභාපතිතුමන් විසින් මෙම වසර 05 පුරා ජාතිභේද දුරුකර එකාවන්ව මේ වන තුරු කටයුතු කළ බවත් අවස්ථාවන්ට අදාළව තම පක්ෂය විසින් සහයෝගය ලබා දුන් බවත් ඇතැම් කරුණු කාරණා සඳහා විරුද්ධ වූ බවත් මන්ත්‍රීවරයෙකු ලෙස ගනු ලබන තීරණ හුදෙක් පක්ෂයේ ප්‍රතිපත්තියක් මත සිදු කරන බවත් ප්‍රකාශ කළ අතර ගරු සභාපතිතුමන්ගේ ඉදිරි වර්ෂය ජයග්‍රාහී අන්දමින් ජනතා සේවය සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්. සුදර්ශන මහතා අදහස් දක්වමින් මේ වන විට සභා ධූර කාලය නිම වෙමින් පවතින බවත් ප්‍රදේශයේ ජනතාවට සේවයක් සිදු කළ බවට සතුටු විය හැකි බවත් දියතලාව සතිපොළ, වැසිකිළි පද්ධතිය , වීථි පහන් ආදී කරුණු මේ වන විට යථාර්ථයක් බවට පත් වී ඇති බවත් 100%ක් නොව යම්තාක් දුරට ප්‍රජාව වෙනුවෙන් කටයුතු සිදු කර ඇති බවත් ඇතැම් යෝජනා මේ වන තුරු සිදු වී නොමැති බවත් තමා පළමු සභා වාරයේදී ලබා දුන් යෝජනාව වන දොඩම්වත්ත කහගොල්ල මාර්ගයේ පාලම ඉදි කිරීම් කටයුතු මේ වන තෙක් සිදු වී නොමැති බවත් ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ද මේ යෝජනාව ලබා දී ඇති බවත් මේ වන තුරු එය සිදු වී නොමැති බවත් රක්ෂිත ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් යෙදිය යුතු බවත් , ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග පද්ධති මැනීමට කටයුතු කළ යුතු බවත් , අනවසර ඉදි කිරීම් නැවැත්වීමට කටයුතු කළ යුතු බවත්,සුසාන භූමි මැනුම් කර නිරවුල් කිරීම, කසළ දැමීම තහනම් කිරීම සඳහා දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම ,ප්‍රජාශාලා , සායනික මධ්‍යස්ථාන නඩත්තු කිරීම, දියතලාව මහ විද්‍යාලයේ ක්‍රීඩාපිටියෙහි පස් මාර්ගයට ඒම , දොඩම්වත්ත මාර්ගයේ දිවෙන බස් රථය ,දියතලාව හෙළවත්ත පාලම ඉදි කිරීම , සංදේශ හා පෙත්සම් වාරයේ ඉදිරිපත් කළ යෝජනා සඳහා පිළිතුරු ලිපියක් මේ වනතුරු නොලැබීම පිළිබඳ නිරන්තරයෙන් සභාව තුළ සාකච්ඡා සිදු කළ බවත් නමුත් මේ කරුණු මේ වන විට යථාර්තයක් වී නොමැති බවත් මහජන නියෝජිතයන් ලෙස ඇත්ත වෙනුවෙන් පෙනී සිටින මිනිසුන් ලෙස ගමට කිසිදු කටයුත්තක් සඳහා මැදිහත් වීමක් සිදු නොකළ පිරිසක් බවට ප්‍රජාව හඳුනා ගෙන ඇති හෙයින් ප්‍රජාවට මුහුණ දීමට අපහසු වී ඇති බවත් මේ වන තුරු ගන්නා ලද දේශපාලන තීන්දු තීරණ වල ඉදිරි ප්‍රතිඵල අනාගත දරුවන් ට මුහුණ දීමට සිදු වී ඇති බවත් අනාගත පරපුර ණයකරුවන් බවට පත්වී ඇති බවත් වර්තමානය වන විට තරුණ පිරිස් රට

හැර දමා යන තත්ත්වයට පත් වී ඇති බවත් රටේ දේශපාලන විසින් මේ දක්වා සිදු කළේ කුමක් ද යන්නත් අනාගතයේ හෝ දියුණු රටක් බවට පත් කිරීමට ගම නියෝජනය කරන සියලු දෙනාගේම යෝජනා ගෙන යථාර්ථයක් බවට පත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් , සමිති මගින් ලබා දුන් යෝජනා ඉතා වටිනා යෝජනා බැවින් පේෂ කර්මාන්තය දියුණු කිරීම වැනි අංශ කෙරෙහි යොමු වීමෙන් විදේශ විනිමය උපයා ගැනීමට එවැනි යෝජනා සිදු කළ යුතු බවත් ප්‍රකාශ කළ අතර ගරු සභාපතිතුමන් පෞද්ගලිකව ඉතා ගුණ යහපත් පුද්ගලයෙක් බවත් ජාතිභේද පසෙකලා සහයෝගයෙන් මේ වන තෙක් කටයුතු කළ බවත් සභාපති ධූරය නැවත ලැබේවායි යන්න ප්‍රාර්ථනා කරන ලදී.

ගරු උප සභාපති වයි.එම්. නිමල් අමරසිරි මහතා අදහස් දක්වමින් 2018 වර්ෂයෙන් පසු පැවති පළමු අයවැය ලේඛනයට මුලින්ම විරුද්ධ වූයේ තමා ප්‍රමුඛ තම කණ්ඩායම බවත් එය දේශපාලන කරුණු මත සිදු වූ බවත් ගරු සභාපතිතුමන් ලේකම්තුමිය විසින් පනතට ප්‍රකාරව අයවැය ලේඛන සකස් කර ඇති බවත් මෙම අයවැය ජනතාවාදී අයවැයක් නොවන බවත් ජනතාව බලාපොරොත්තු වන්නේ මාර්ගය සකස් කිරීම. බෝක්කුවක් යෙදීම ආදී කටයුතු සභාව හරහා සිදු කර ගැනීමයි. ඇතැම් යෝජනා ඉදිරිපත් කළ ද ඒවා සභාව හරහා ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් වෙනත් ප්‍රාදේශීය සභා වල මෙන් නොව ගරු සභාපතතුමන් ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය ඉතා සහයෝගයෙන් මේ වන තුරු කටයුතු සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදී.

කෙටුම්පත් අයවැය ලේඛනය සභා සම්මත කිරීම සඳහා විවෘත ඡන්දයක් පැවැත්වීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.සුදර්ශන මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති වයි.එම්.නිමල් අමරසිරි මහතා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>හපුතලේ ප්‍රාදේශීය සභාව</u>**
**<u>2022 සැප්තැම්බර් මස 30 වන දින විශේෂ මහා සභා රැස්වීම</u>**
**<u>2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම.</u>**

| **2023 අයවැය සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම** | **2023 අයවැය සඳහා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම** | **2023 අයවැය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීම** | **2023 අයවැය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට නොපැමිණීම** |
|---|---|---|---|
| බී. කන්දසාමි මයා | ආර්.එල් සුදර්ශන මයා | ආර්.එම්.අයි.රාමනායක මයා | කේ.ඒ චන්දන කිත්සිරි මයා |
| වයි.එම් නිමල් අමරසිරි මයා | | ඩී. සුදත් අරුණ රංජන මයා | |
| සෙල්ලයියා සගාදේවන් මයා | | | |
| කේ.එම් විමලසිරි මයා | | | |
| ඒ.එම් සිගිරි ලංකා මයා | | | |
| ගෝපාලන් මුරුගන් මයා | | | |
| එල් ඉන්දික සම්පත් මයා | | | |
| සවරිමුත්තු ප්‍රභාහර් මයා | | | |
| පී. වයලට් රෝස් මිය | | | |
| එම් කන්දසාමි මයා | | | |
| තංගවේලු මහේන්ද්‍රන් මයා | | | |
| වේලුසාමි එලිල් අරසි මිය | | | |
| එම් .ඒ නිල්මිණි මිය | | | |

| | | | |
|---|---|---|---|
| එච්.ඒ.ඩී. සී. මානෙල්කුමාරි මිය | | | |

**සාරාංශය**

| | |
|---|---|
| 2022-09-30 දින සහභාගී වූ ගරු මන්ත්‍රී සංඛ්‍යාව | **17** |
| 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සංඛ්‍යාව | **02** |
| 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සංඛ්‍යාව | **14** |
| 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සංඛ්‍යාව | **01** |
| 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නොපැමිණි සංඛ්‍යාව | **01** |
| **සමස්ත පක්ෂ ඡන්ද සංඛ්‍යාව** | **14** |

ඒ අනුව 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා සභිකයන් 14 දෙනෙකු පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා සභිකයන් 01අයෙකු විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී. 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා සභිකයන් 02 නෙකු ඡන්දය දීමෙන් වැළකී සිටි අතර වැඩි ඡන්ද 13 කින් 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සභා සම්මත විය.

ගරු සභාපතිතුමන් විසින් ප්‍රාදේශීය සභා අයවැය බලාත්මක කිරීමේ රීති අංක 12 (5) ප්‍රකාරව ඡන්ද විමසීමේදී විපක්ෂව ඡන්දය ලබා දුන් සභිකයා වෙත තමන් එසේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ කවර හේතුවක් නිසාද යන්න පැහැදිලි කරන ලිඛිත සන්නිවේදනයක් එම රැස්වීම පවත්වනු ලැබූ දින සිට දින 07ක් ගත වීමට පෙර පළාත් පාලන කොමසාරිස්වරයාටද පිටපතක් සහිතව ලේකම්වරයා වෙත භාර දිය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව මෙකී යෝජනාව සඳහා ගරු සභාවේ එකඟතාවය විවෘත ඡන්දයක් පැවැත්වීම මගින් විමසන ලද අතර 2023 වර්ෂයේ කෙටුම්පත් අයවැය සඳහා සභිකයන් 14 දෙනෙකු පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර විපක්ෂව 01 සභිකයෙකු ඡන්දය ප්‍රකාශ කර බහුතර ඡන්දයෙන් මෙකී යෝජනා සභා සම්මත විය.

**06. කාරක සභා වාර්තා**

නැත

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

නැත

**08. වෙනත් කරුණු**

නැත

2023 කෙටුම්පත් අයවැය සඳහා ඡන්දය ලබා දුන් සියලුම සභිකයන් වෙත හපුතලේ ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස තමා ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදී.

මෙදින සභා රැස්වීම ප.ව.12.00ට අවසන් විය.

බී.කන්දසාමි,
සභාපති,
හපුතලේ ප්‍රාදේශීය සභාව,
දියතලාව.